*Nāgānanda Journal of Cultural Anthropology (NJCA) 2023, Vol. 01 (01)*
Article History: Received 15 July 2023 | Accepted 28 December 2023
Issue Published Online: 02 January 2024
ISSN No: ISSN 3030-7252

# රිද්දියාගය ශාන්තිකර්මයෙන් සන්නිවේදනය වන මනෝචිකිත්සාව හා ගර්භාරක්ෂණය

පීරිස්, එන්. එස්.
සිංහල අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
nadeeka.pieris@yahoo.com

**සාරසංක්ෂේපය**

අමනුෂ්‍ය උපද්‍රව සහ රෝග පීඩාදී මිනිස් දිවියට පීඩා පමුණුවන කාරක දුරු කොට සෞභාග්‍යය උදා කර ගැනීම සඳහා සිංහල ශාන්තිකර්ම බිහි විය. ඒවා උඩරට, පහතරට, සබරගමු යනාදී වශයෙන් භූගෝලීය පිහිටීමට අනුව ප්‍රවර්ග කර හඳුනා ගත හැකි අතර, පහතරට ප්‍රදේශයෙහි යකුන් විෂයයෙහි පවත්නා ශාන්තිකර්ම වශයෙන් සන්නියකුම, රිද්දියාගය, මහසෝන් සමයම, සූනියම් ශාන්තිය, කළුකුමාර සමයම, ගොපලු සමයම යනාදිය සැලකෙයි. රිද්දියාග මංගල්‍යය පහතරට ප්‍රදේශයන්හි යක්ෂයින් උදෙසා පවත්වනු ලබන ප්‍රධාන ශාන්තිකර්මයක් වන අතර මාතර, බෙන්තර ප්‍රදේශවල මෙය ප්‍රචලිත ව පවතියි. සිංහල නර්තන කලාවෙහි භාව පූර්ණ නෘත්‍ය රංග ලක්ෂණවලින් සැදුම් ලත් මෙය කාන්තාවන් උදෙසා යකුන් විෂයයෙහි පවත්වන එක ම ශාන්තිකර්මය යි. ගර්භ සංරක්ෂණය මූලික කොට ගනිමින් විවාහයෙන් පසු දරු ඵල නොමැති කාන්තාවන් උදෙසා දරු ගැබ් ඇති කර ගැනීම, ගර්භිණී කාන්තාවන්ට ආරක්ෂාව සලසා දීම, අතුරු අන්තරාවකින් තොර ව බිහි කිරීමට මානසික පසුබිම සැකසීම, සශ්‍රීකත්වය හා සෞභාග්‍යය යන මූලික පරමාර්ථ පෙරදැරි කරගෙන රිද්දියාගය ශාන්තිකර්මය පැවැත්වේ. එහි දී උපත් කථාව, සංවාද, ගායනා, පූජා චාරිත්‍ර, නාට්‍යමය පෙළපාලි හා රංග භාණ්ඩ ආදි සියලු රංගෝපක්‍රම මගින් ශාන්තිකර්මකරුවා ඉතා සියුම් ආකාරයෙන් දරුවන් නොමැති කාන්තාවට හෝ ගර්භනී කාන්තාවට මානසික සුවයක් ලබා දෙන අතර මානව හිතවාදී සානුකම්පිත දෘෂ්ටියකින් බැලීම සිදු ව ඇත. මෙලෙස රිද්දියාගය ශාන්තිකර්මයෙන් මනෝ චිකිත්සාව හා ගර්භාරක්ෂණය සිදු වන්නේ කෙසේ ද යන පර්යේෂණ ගැටලුවට අනුව සිදු වන මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත වුණි. මූලික වශයෙන් පුස්තකාල පරිශීලනය මගින් ප්‍රාථමික හා ද්විතීයික දත්ත රැස් කර ගන්නා අතර සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන් සහභාගීත්ව නිරීක්ෂණය සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය මගින් තොරතුරු විශ්ලේෂණය සිදු ව ඇත.

**ප්‍රමුඛ පද:** *ගර්භාරක්ෂණය, මනෝචිකිත්සාව, රිද්දියාගය, ශාන්තිකර්ම, සන්නිවේදනය*

*Corresponding author: Pieris N.S., Email: nadeeka.pieris@yahoo.com*

**හැඳින්වීම**

මානවයා වූ කලී ක්ෂීරපායී සත්ත්වයෙකු මෙන් ම දියුණු මනසක් ඇති සත්ත්ව කොට්ඨාසයකි. මිනිසා ඇතුළු විවිධ සත්ත්වයින් බිහි ව ඇත්තේ ප්‍රජනන ක්‍රියාවලියක් මූලික කොටගෙන ය. මානව වර්ගයා එකී ක්‍රියාවලිය ඉතා වැදගත් කොට සැලකූ අතර, මෙහි දී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම ලිංගික ක්‍රියාවලියකින් සිය වර්ගයා බෝ කිරීම සිදු වෙයි. මන්ද එය මානව වර්ගයාගේ ඉදිරි පැවැත්ම සඳහා ප්‍රමුඛ වන බැවිනි. ස්ත්‍රියක සහ පුරුෂයෙකු සංසර්ගයෙන් පසු ව, පිට වන ඩිම්බ සහ ශුක්‍රාණු සංසේචනය වීමෙන් කලලයක් හට ගනී. ඒ වූ කලී දරු ගැබකි. වෛද්‍ය විද්‍යාවට අනුව ගර්භයක් යනු (සත්ත්ව) පුරඃප්‍රසව අවධියේ දී භ්‍රෑණයෙහි රැඳී පවතින ඩිම්බ ප්‍රණාලයේ අපර කොටස හෙවත් චත්වාලය, ධරාලය ලෙස හඳුන්වයි. (විජේතුංග, 1978) පිළිසිඳ ගත් අවස්ථාවේ සිට බිහි වීම දක්වා මෙම ගර්භය මැනවින් ආරක්ෂා කිරීම ගර්භ සංරක්ෂණය  නොහොත් ගැබ් පෙරහැර නම් වෙයි.

අතීත සිංහල සමාජයේ දෛනික දිවිය හා බැඳි උත්සව අතර ගැබ් පෙරහැර දැක්වීම නොකඩවා පැවැත්වූවකි. ගර්භාරක්ෂණ පිළිවෙත් පිළිබඳ ව පුරාණ සිංහල හා පාලි ග්‍රන්ථවල ද සඳහන් වෙයි. මහා පරාක්‍රමබාහු කුමරු සිය මවු කුස පිළිසිඳ ගත් අවස්ථාවේ දී, පියරජතුමා දේවියට ගැබ් පෙරහැරක් කළ බව චූලවංශයේ  සඳහන් වන අතර, ධම්මපදට්ඨ කථාවේ චක්ඛුපාල වස්තුවේ ගැබ් පෙරහැරක් පිළිබඳ ව ද, ගර්භාරක්ෂණය මවු කුස පිළිසිඳ ගත් ගැබක් ආරක්ෂා කිරීමට අනුගමනය කරන චාරිත්‍රයක් බවත්, ගැබ්ගෙන සිවු මසක් ගිය පසු ව එම චාරිත්‍ර කළ යුතු බවත් ගෘහ්‍ය සූත්‍රයේ දක්වා ඇත. (සිංහල විශ්වකෝෂය, 1998, 9 වන කාණ්ඩය ) සිංහල ගැමි සමාජයේ පූර්ව අවධියේ දී ශාන්තිකර්ම ආශ්‍රිතව ගර්භ සංරක්ෂණ වත් පිළිවෙත් සිදු කළ අතර,  දේශීය ආයුර්වේදය ඇසුරෙන් සිදු වන වෛද්‍යමය ප්‍රතිකර්ම හා ආගමික වශයෙන් සිදු කරන ගර්භාරක්ෂණ වත්පිළිවෙත් සිදු කළ බව පෙනේ.

මනුෂ්‍ය වර්ගයාගේ කායික හා මානසික ප්‍රතිකර්මයක් ලෙස යක්ෂයින්, දෙවියන්, ග්‍රහයින් උදෙසා සිදු කරන කිසියම් පූජා කර්මයක් ශාන්තිකර්මයක් ලෙස හැඳින්විය හැකි අතර, මෙය උඩරට, පහතරට සහ සබරගමු සම්ප්‍රදායන් අනුව ද වෙන් කොට හඳුන්වා දිය හැකිය. සිංහල ශබ්දකෝෂයේ සඳහන් අන්දමට 'ග්‍රහ අපල ආදිය දුරු කරනු වස් කරනු ලබන යාග විධිය, මන්ත්‍ර ගුරුකම් ආදිය මගින් කරනු ලබන සෙත් ශාන්තිය' යනුවෙන් ශාන්තිකර්ම හඳුන්වා ඇත. (සිංහල ශබ්දකෝෂය, 1991, 24 වන කාණ්ඩය) අතීත සමාජයේ ශාන්තිකර්ම ලෙඩ රෝග සහ අපල උපද්‍රවවලින් ආරක්ෂා වීම, හව බෝග සම්පත් දියුණු කර ගැනීම, ගොවිතැන් බතට සම්බන්ධ වූ ගව මහීෂාදීන් රැක ගැනීම යනාදි සමාජ අවශ්‍යතා සඳහා පාරම්පරික ව ගුරු ඇඳුරු පරම්පරා මගින් ක්‍රියාත්මක විය.

මේ අතර මනෝචිකිත්සනය හා ගර්භ සංරක්ෂණය සඳහා වත් පිළිවෙත් සිදු කිරීම විශේෂිත ය.  දරුවෙකු පිළිසිඳුණු පසු එය අදෘශ්‍යමාන යක්ෂ, භූත ආදි බලවේගවලින්  විනාශ වන්නට නොදී ආරක්ෂා කර ගැනීමට ශාන්තිකර්ම මගින් සෙත සැලසිණි. උඩරට, පහතරට සහ සබරගමු සම්ප්‍රදායයන් තුනට ම අයත් ශාන්තිකර්ම මගින් එය සිදු වෙයි. උඩරට නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්මයක් වන කඩවර කංකාරිය, පහතරට නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්මයක් වන රිද්දියාගය සහ සබරගමු නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්මයක් වන කුමාර සමයම මෙයට අදාළ ය. මෙම ශාන්තිකර්ම කාන්තාවන් උදෙසා ම පවත්වනගර්භ සංරක්ෂණ පූජාවන් ය.

ඉහත සඳහන් පරිදි එම ආරක්ෂාව සඳහා ම නිපන් ශාන්තිකර්මයක් වශයෙන් රිද්දියාගය හෙවත් රටයකුම ශාන්තිකර්මය දැක්විය හැකි ය. මෙම ප්‍රකාශය සනාථ කර ගනු සඳහා රිද්දියාගය ශාන්තිකර්මය පිළිබඳ ව අවධානය යොමු කළ විද්වතුන් කිහිප දෙනෙකුගේ  අදහස් වැදගත් වේ. ඉතා රසවත් අනුරූපණ පෙළපාළි දක්නට ලැබෙන එක්තරා ගැබ් පෙරහර වෙසෙසක් ලෙසින් තිස්ස කාරියවසම් හඳුන්වා දී ඇති අතර, (1976) රිද්දියාගය නොහොත් රට යකුම මුළුමනින් ම ගත් කල ගර්භ සංරක්ෂණය පිළිබඳ ශාන්තිකර්මයක්[5] ලෙස එදිරිවීර සරච්චන්ද්‍ර ද දක්වා තිබේ. (1997)

ශාන්තිකර්ම බිහි වීමට තුඩු දුන් කරුණු අතරින් ස්ත්‍රීන් කරණකොට සිදුවන්නා වූ මෙම ශාන්තිකර්මයේ අරමුණ ගර්භ සංරක්ෂණ ක්‍රියාවලියක් ලෙස දැක්විය හැකි ය. එසේ හෙයින්,

- දරු එල නොමැති කාන්තාවන් සඳහා දරු ගැබ් ඇති කර ගැනීම,
- පිළිසිඳ ගත් ගැබ ආරක්ෂා කිරීම සඳහා දරුගැබ අකලට ගබ්සා වී ලේ කිලිමාලය වැනි රෝග දුරු කර ගැනීම,
- කුස තුළ පිළිසිඳගත් දරුවන් ප්‍රසූතියට පෙර කුස තුළ දී මිය යාම හා මළ දරු උපත් වළක්වා ගැනීමටත් එවැනි උපද්‍රවයන්ගෙන් දරුවාත් මවත් අරක්ෂා කර ගැනීම,
- ගර්භණී මාතාව යහපත් දරු ප්‍රසූතියක් සඳහා මානසිකව සුදානම් කිරීමත් රිද්දියාගයේ මුඛ්‍ය අරමුණු ලෙස දැක්විය හැකි ය.

**සාහිත්‍ය විමර්ශනය**

'රිද්දියාගය ශාන්තිකර්මයෙන් සන්නිවේදනය වන මනොචිකිත්සාව හා ගර්භාරක්ෂණය' යන මෙම අධ්‍යයනයට අදාළ ව ඍජු ව ම ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි පළ වී නොමැති වූ ව ද රිද්දියාගය ශාන්තිකර්මයට අදාළ ව ලියැවුණු කරුණු ද වෙනත් ශාන්තිකර්ම ඇසුරෙන් ඉදිරිපත් වූ පූර්ව පර්යේෂණ ප්‍රකාශයට පත් වී තිබේ. ඒ අතර දේශීය ශාන්තිකර්ම හා ජන නාටකයන්හි අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ පිළිබඳ කරුණු විමසමින් ශාස්ත්‍රීය වශයෙන් පර්යේෂණාත්මක කරුණු රැසක් එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ඉංග්‍රීසි භාෂාවෙන් රචිත 'Sinhalese Folk Play' (1953) මගින් ඉදිරිපත් වුණි. පසු ව එය 1968 දී 'සිංහල ගැමි නාටකය' යනුවෙන් සිංහලයට නැගුණු අතර, එහි දී රිද්දියාගය ශාන්තිකර්මයෙහි අන්තර්ගතය හා පූජා විධි පිළිබඳ නාට්‍යමය දෘෂ්ටිකෝණයකින් විමර්ශනයට ලක් කර ඇත. ඉතා රසවත් අනුරූපණ පෙළපාළි ඇතුළත් රටයකුම එක්තරා ගැබ් පෙළහැර වෙසෙසකැයි ද සඳහන් කරයි.

පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය මෙහෙවරක නිරත වූ තිස්ස කාරියවසම් මහතාගේ 'ශාන්තිකර්ම හා සිංහල සමාජය' (1975) ග්‍රන්ථයෙහි දී පහතරට පළාත්හි ජනප්‍රිය යක් තොවිල් පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇති අතර, එහි දී රිද්දියාගය ශාන්තිකර්මයෙහි අන්තර්ගත පූජා විධි හා වත් පිළිවෙත් පිළිබඳ සාකච්ඡා කර ඇති අතර රටයකුම ගර්භ සංරක්ෂණය සඳහා සිදු කරන ශාන්තිකර්මයක් ලෙස එතුමා පවසා ඇත. රට යක්කු වනාහි කාන්තාවන්ගේ දරු උපත් වළකන, මහමේරුව පළාගෙන එහි හට ගත් ගින්නෙන් උපන් භූතයෝ යැයි පවසා ඇත. එතුමාගේ ම රටයකුම හෙවත් රිද්දියාගය (1982) කෘතියෙහි ද මෙම ශාන්තිකර්මය පිළිබඳ විස්තරාත්මක ව ඉදිරිපත් කළ ද එයින් ශාන්තිර්මයෙන් සිදු වන මනෝචිකිත්සනය හා ගර්භාරක්ෂණය පිළිබඳ තොරතුරු දක්වා නොමැත.

1995 වසරේ දී ප්‍රකාශයට පත් වූ ජයසේන කෝට්ටේගොඩ මහතාගේ 'පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය' නමැති කෘතියෙහි දී මූලික වශයෙන් රිද්දියාගය පිළිබඳ විස්තරාත්මක ව සාකච්ඡා කර ඇත. උපත් කථාව, පූජා විධි රටාව මිස එහි ගර්භාරක්ෂණය පිළිබඳ සාකච්ඡාවට ලක් වී නොමැත. එතුමාගේ සම්භාව්‍ය නර්තන සමීක්ෂා (2001) නමැති කෘතියේ දී ද රිද්දියාගය ශාන්තිකර්මය පිළිබඳ හඳුන්වා එහි තොරතුරු සංක්ෂිප්ත ව ඉදිරිපත් කර ඇත. උක්ත කෘති මගින් රිද්දියාගය ශාන්තිකර්මය පිළිබඳ විස්තර ඉදිරිපත් කළ ද එයින් සිදුවන මනෝ චිකිත්සන ප්‍රතිකර්මය හා ගර්භ සංරක්ෂණය පිළිබඳ විවරණය කර නොමැත. එබැවින් 'රිද්දියාගය ශාන්තිකර්මයෙන් සන්නිවේදනය වන මනොචිකිත්සාව හා ගර්භාරක්ෂණය' යන මෙම අධ්‍යයනය මගින් එම පර්යේෂණ හිඩැස පරිපූර්ණ කිරීම පරමාර්ථය වෙයි.

**පර්යේෂණ අරමුණ**

රිද්දියාගය ශාන්තිකර්මයෙන් සපයන සන්නිවේදනාර්ථ මගින් සිදු වන මනෝචිකිත්සන ක්‍රියාවලිය හා එයින් සිදු වන ගර්භ සංරක්‍ෂණය පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන  අරමුණ යි. ඒ සඳහා ආංගික, වාචික, සාත්වික හා ආහාර්ය යන සතර අභිනය, නානුමුරය, දරු නැළවිල්ල, කුල්ලේ පිදේනිය යනාදි නර්තන

හා නාට්‍යමය පෙළපාළි හා වාචික සන්නිවේදනය මගින් මනෝචිකිත්සන ක්‍රියාවලිය සිදු වන අයුරු විග්‍රහ කිරීම සිදු කර පසු ව එමගින් ගර්භ සංරක්ෂණය සිදු වන අයුරු විමසීම අපේක්ෂා කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා අනුගාමික පර්යේෂණ විධි දෙකක් භාවිත කර ඇත. එනම් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල පරිශීලනය මගින් ප්‍රාථමික හා ද්විතීයික දත්ත එක් රැස් කිරීම එක් ක්‍රමයකි. දෙවන ක්‍රමය වන්නේ සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන් සහභාගීත්ව නිරීක්ෂණය සහ ප්‍රත්‍යෙයක අධ්‍යයනය මගින් තොරතුරු විශ්ලේෂණය යි. සහභාගීත්ව නිරීක්ෂණයේ දී ඍජු ව ම සිදු වූයේ සෞන්දර්ය විශ්වවිද්‍යාලයෙහි පැවැත්වූ රටයකුම ශාන්තිකර්මය නරඹා එය මනා ව නිරීක්ෂණයෙන් අත්‍යවශ්‍ය කරුණු එක් රැස් කිරීම යි. එහි දී නිරීක්ෂණය කරන ලද තොරතුරු මගින් එම ශාන්තිකර්මය සඳහා යොදා ගත් රංග වස්ත්‍රාභරණ, රංග භාණ්ඩ හා පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලබා ගෙන ඇත. ප්‍රත්‍යෙයක අධ්‍යයනය යටතේ විෂයානුබද්ධ කරුණු පිළිබඳ දැනුමෙන් සපිරුණු පුද්ගලයන් මුණ ගැසී ඔවුන් සමඟ රිද්දියාගය ශාන්තිකර්මය පිළිබඳ තොරතුරු සාකච්ඡා කළේ ය. එහි දී විෂයානුබද්ධ පාරම්පරික ශාන්තිකර්ම ශිල්පීන් මෙන් ම විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු ඇතුළු විවිධ තරාතිරමේ ශාස්ත්‍රීය විද්වතුන් රැසක් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්විණි.

**රිද්දියාගය ශාන්තිකර්මයේ අන්තර්ගත සතර අභිනය මගින් සන්නිවේදනය වන මනෝචිකිත්සනය**

දරුවන් නොලැබී යාමට හා දරුවන් ගබ්සා වීමට මවගේ මානසික සිතිවිලි හේතු විය හැකි ය. ඒ සඳහා මානසික චිකිත්සනය යොදා ගත හැකි ය. මානසික චිකිත්සනය යනු පුද්ගලයෙකුට වැළඳිය හැකි මානසික පීඩාවන්ට පිළියම් කිරීමට භාවිත කරන ක්‍රමයකි. 'චිකිත්සනය' යන්න කිත් ධාතුවෙන් නිෂ්පන්න වන ස්ත්‍රී ලිංග කෘදන්ත පදයක් බවත්, කිත් යන ධාතුවෙහි අදහස වන්නේ රෝග නිවාරණය බවත් 'චිකිච්ඡා' යනුවෙන් පාලි භාෂාවෙහි ශබ්ද වන අතර, නිරෝගීභාවය උදා කර දීම සඳහා කරනු ලබන සමස්ත ක්‍රියා පටිපාටිය යන්න අදහස් වේ.[6] (සිංහල විශ්වකෝෂය, 2006, 11 වන කාණ්ඩය) එවැනි චිකිත්සන ක්‍රම රාශියක් තිබෙන අතර රඟ දැක්වීම(Role play exercise), ආකෘතිකරණය(Modeling), අනුක්‍රමික විසංවේදනය(Systemic desensitization), ක්‍රියාකාරකම් පුහුණුව(Asertion Training), අපුල තත්ත්වාරෝපණය(Aversive conditioning) යනාදී චිකිත්සන ක්‍රම දැක්විය හැකි ය. මෙම චිකිත්සන ක්‍රම රිද්දියාගය ශාන්තිකර්මය මගින් සිදු වන බව පැහැදිලි වේ.

**සතර අභිනය**

අභිනයදර්පණයේ දැක්වෙන අන්දමට රස හා භාව නිරූපණය සඳහා කරනු ලබන චලන 'අභිනය' නම් වෙයි. (නන්දිකේශ්වර, 1991) මෙම අභිනය ප්‍රභේද සතරකට වෙන් කර ඇත. එනම් ආංගික, වාචික, සාත්වික සහ ආහාර්ය යන අභින යි. ආංගික අභිනය දක්වනුයේ ශරීරයේ අංග, ප්‍රත්‍යංග සහ උපාංග මගිනි. පංචේන්ද්‍රියයන් මගින් ප්‍රේක්ෂකයා වෙත නිරූපණය කරන සන්නිවේදන ක්‍රමය ආංගික අභිනය යැයි පැවසිය හැකි ය. එය තාත්වික ව හෝ රිද්මයානුකූල ව සිදු කළ හැකි ය. වාචික අභිනය යනු ගද්‍ය හෝ පද්‍ය වශයෙන් වචන මාධ්‍ය කොටගෙන කරන අදහස් ප්‍රකාශන විධිය යි. වාචික අභිනයෙහිලා ශබ්දය ප්‍රධාන වෙයි. නිදසුනක් වශයෙන් ගීත නාටක ගත හැකි ය. සංස්කෘත නාට්‍යවල දී දෙබස් උච්චාරණය සඳහා ශිල්ප ක්‍රම රැසක් භාවිත කරයි. (මාරසිංහ, 1998) මනසෙහි හට ගන්නා මනෝභාව ඉන්ද්‍රියයන් මගින් නිරූපණය කිරීම සඳහා සාත්වික අභිනය මාධ්‍ය කර ගනියි. මෙවැනි සාත්වික අභින හතක් පිළිබඳ සඳහන් වේ. ස්තම්භ (ඇඟ දරදඬු වීම), රෝමාංච (රෝමෝද්ගමනය වීම), වේ පථු (වෙව්ලීම), ස්වරභංග (කෑ ගැසීමට හෝ කටහඬ පිට කිරීමට අපහසු වීම), ස්වේද (හීන්දාඩිය දැමීම), අශ්‍රූ (දෑස් කඳුළින් තෙත් වීම), වෛවර්ණ (මුහුණ රතු වීම වැනි සිරුරේ පැහැය වෙනස් වීම), ප්‍රලය (සිහි මුර්ජා වීම) යනාදිය යි. සාත්වික භාව වැදගත් වනුයේ ප්‍රකාශනාත්මක චලන නිරූපණයේ දී ය. ඇඳුම් පැළඳුම්, වේශ නිරූපණය වැනි බාහිර අංග මගින් භාවයන්ගේ අර්ථවත් බව ඔපවත් කර ගනු ලබන්නේ ආහාර්ය අභිනයෙනි. වේදිකා සැරසිලි හා ආලෝකය ආදිය ද වස්තුවටත්, කථා ශරීරයටත්, අවස්ථාවටත් උචිත පරිදි

සකස් කර ගැනීම නර්තනයක චරිතයට ගැළපෙන රංගවස්ත්‍රාභරණවලින් එම චරිතය වඩාත් උද්දීපනය කිරීම සිදු වේ. නැටුමේ අලංකාර බව ප්‍රේක්ෂක ප්‍රසාදය දිනා ගැනීමට ද මූලික වන්නේ ආහාර්ය අභිනය යි.

**රිද්දියාගය ශාන්තිකර්මයෙහි භාවිත සතර අභිනය**

පහතරට ශාන්තිකර්ම ආශ්‍රිත ව රිද්මයානුකූල චලන රාශියක් දැක ගත හැකි අතර රිද්දියාගය ශාන්තිකර්මය එයට සුවිශේෂී වෙයි. රිද්දියාගයේ යක් දෙස්සෝ කාන්තා චරිතයකට අනුගත ව ආංගික අභිනය සිදු කරති. මෙහි දී කාන්තාවකගේ සෞම්‍ය ගති පැවතුම් හා ලාලිත්‍යය ආංගික අභිනය මගින් ආතුරයාගේ සිතේ සතුට ඇති වන අයුරින් මනා ආකර්ෂණීය ලෙස නිරූපණය කරන අතර එවැනි නර්තන අංග මගින් සිදු වනුයේ රඟ දැක්වීමෙන් සිදු වන මනෝ චිකිත්සනය යි. එනම්

- නානුමුරය
- කපුයක්කාරිය
- දරු නැළවිල්ල
- කුල්ලේ පිදේනිය

යනාදි නර්තන හා නාට්‍යමය පෙළපාළි දැක්විය හැකි ය. කාන්තාවක් ලෙස ලාලිත්‍යයෙන් යුක්ත ව රංගනයන් සිදු කිරීමෙන් ආතුරයා මානසික ව සුවපත් කිරීමට කටයුතු කරයි. එමෙන් ම ආකෘතිකරණය මගින් සිදු කෙරෙන ධනාත්මක චිත්ත වේගයන් ඇති කරලීම දරු නැළවිල්ල පෙළපාලියෙන් දැක ගත හැකි ය. එහි දී ධනාත්මක චින්තනය සම්ප්‍රේෂණය කිරීම සිදු කෙරෙයි. ආකෘතිකරණය නමැති චිකිත්සන ක්‍රමය දරු නැළවිල්ලෙහි දී සමපාතී ක්‍රියාවලියක් ලෙස සිදු වේ.

මනෝ චිකිත්සන ක්‍රියාවලියක් වන අනුක්‍රමික විසංවේදනයට සමාන ක්‍රියාවලියක් දරු නැළවිල්ල නමැති නර්තන පෙළපාලයි මගින් නිරූපිත ආංගික අභිනයෙන් සිදු වේ. එම ක්‍රමයේ දී ආතුර කාන්තාවගේ කාන්සාව මුසු ස්වභාවයක් ඇත්නම් එය දුරු කිරීමට මෙම පෙළපාලියේ දී දරුවෙකු සිටින බව හැඟවීම, දරුවා නාවන, කිරි පොවන ආකාරය පෙන්වීම මගින් ඇගේ මනසේ චිත්‍රණය කරයි. අනතුරු ව දරු රූකඩය අතට දීමෙන් තවදුරටත් මානසික ව සුවපත් කරයි. මෙම නර්තන පෙළපාලියේ දී ක්‍රියාකාරකම් පුහුණුව යන මානසික චිකිත්සන ක්‍රමය ද සිදු වෙයි.

අතීතයේ ශාන්තිකර්ම පිළිබඳ ලිඛිත මූලාශ්‍රය නොතිබුණු අතර වාචික අභිනය භාවිතයෙන් පරම්පරාවෙන් පරම්පරාවට දායාද වුණු කලාවක් ලෙස දේශීය ශාන්තිකර්ම පද්ධතිය සඳහන් කළ හැකි ය. දේශීය ශාන්තිකර්ම පද්ධතියෙහි භාවිත අභිනයන්ගෙන් වැඩි වශයෙන් දැකිය හැක්කේ වාචික අභිනය යි. ශාන්තිකර්මයක් තුළ දැකිය හැකි සංවාද, කවි, කෝල්මුර ගායනා, සන්න, ශ්ලෝක, යාදිනි, කන්නලව් ආදි බහුතරය මගින් වාචික අභිනය සැකසී ඇත. සංගීත චිකිත්සාව යනු ශාරීරික, මානසික හෝ චිත්තවේගීය තත්ත්වයක් වැඩි දියුණු කිරීමේ අරමුණින් හෝ හුදෙක් කාංසාව නියාමනය කිරීම හා විෂය දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් සිදු කරන ක්‍රියාවලියකි. (බමුණුගම, 2020-05-20) ස්නායු හෝ මානසික ස්වභාවයේ ආබාධ තත්ත්වයන්ට ප්‍රතිකර්ම කිරීමට රිද්දියාගය වැනි ශාන්තිකර්ම ද වැදගත් වේ. ගැබිනි මවකට රිද්දියාගයෙන් ඉදිරිපත් වන ගායන මගින් මනසෙහි නිරෝගී බව රැක ගත හැකි ය. එලෙස මානසික චිකිත්සනයක් ලෙස ඉදිරිපත් වන කවි ගායනා පහත සඳහන් වේ.

**රිද්දියාගයේ උපත**

මුනි දහම් සඟ සරණ පන්සිල් රැගෙන ඉස දොව එඈඳ පිරුවට
දිනිඳු කුජ ගුරු සිකුරු ශනි සහ ගනුව සඳු බුද දෙදෙන හැර සිට
රුදුරු යක් රකුසන් ද යකිනිය වැසුණහොත් අඟනට බිළිඳුට
පොරණ ඉසිවරු පැවසු නම් ලත් රිද්දියාගය කරව මෙලෙසට

- **කිරි අම්මාවරු කවි**

ඇගේ ගෙදර දරු සුරතල් අම්මා
මගේ ගෙදර අඬුරුයි කිරි අම්මා
නෙතේ කඳුළු සළුවෙන් පිස දූම්මා
මටත් පුතෙක් දෙනව ද කිරි අම්මා

- **රිද්දි බිසව් උපත**

එර්දි වෙලා ගිය පුපුරු සතෙන්නේ
රිද්දි බිසව් සත් දෙනෙකි උපන්නේ
එර්දි වෙමින් රන් මාළිග උන්නේ
රිද්දි බිසෝවරු තෙද පවසන්නේ

- **කුල්ලේ පිදේනිය සන්න**

පැරකුම්බාහු යන - රජ සිරි විඳින බව දැක
යුදට මුළු රට යන - ගොසින් අණ බෙර ලවා හැම තැන
ඇද්ද කොඩි මුදුනට - දැකලා බිසව් එම විට
මැරුණු බව නො ව තුට - පැනපු මරණෙට ගොසින් ඇල්ලට (කොට්ටගොඩ, 1996)

රිද්දියාගය ශාන්තිකර්මය අනෙකුත් ශාන්තිකර්මවලට වඩා සාත්වික අභිනය පෘථුල ලෙස විදහා දක්වයි. එයට හේතුව වන්නේ රිද්දියාගයේ යකැදුරා කාන්තා චරිතයක් නිරූපණය කිරීම යි. රිද්දියාගය ශාන්තිකර්මයේ භාවිත වන ඇඳුම් කට්ටල් කිහිපයක් ම දැක්විය හැකි ය. හැන්දෑ සමයමෙහි සිට පැදුරේ දූපවිල්ල දක්වා සුදු පැහැති සේලය සහ සුදු හැට්ටය ඇඳ නර්තනයේ යෙදෙන අතර, රිද්දි සමයමේ සිට නව මාලයේ පිදේනිය දක්වා රතු, සුදු, කළු වර්ණ ද විවිධ මෝස්තරයෙන් වැඩ දැමූ සාය ද, සේලය උඩින් ද, හිසට කිරුළු තොප්පියක් ද පලඳියි. පෙළපාළි දැක්වීමේ සිට කුල්ලේ පිදේනිය දක්වා කාන්තා චරිත නිරූපණය සඳහා උචිත වස්ත්‍රාභරණ පැලඳ චරිත නිරූපණය කරයි.

ලිංගික කාර්යයට උචිත පරිසරයක් ගොඩ නඟා ගැනීමේ දී කාන්තාව නා පිරිසිදු වී සුවඳ විලවුන් ගල්වා ආභරණයෙන් සැරසී යා යුත්තී ය. ස්වාමියා එකී කාර්යයට අද්දවා ගැනීමට හැකි වන ආකාරයේ සැරසීමක් අවශ්‍ය වේ. කාන්තාවක් එසේ විය යුතු බව නානුමුරය නර්තන පෙළපාළියෙන් අඟවයි. කාන්තා ලාලිත්‍යයෙන් යුක්ත චලන හා රංගනයෙන් යුක්ත ගමන් විලාස ඇති ව කාන්තාවක් නා පිරිසිදු වන ආකාරය, සුවඳ විලවුන් ගල්වා ආභරණ පැලඳ හැඩ වැඩ වන අයුරු එයට ඇතුළත් ය. කාන්තාවකගේ මෙවැනි ක්‍රියා කලාපයක් පැවතීම සාර්ථක ලිංගික ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වන අතර, දරු උපතක් සඳහා අවශ්‍ය වූවකි.

ආදරය, දයාව මවකගේ ගති ස්වභාව වන අතර, රිද්දියාගයේ දරු නැළවිල්ල රඟ දැක්වීමෙන් ඒ බව නිරූපණය කරයි. දරුවෙකු පිරිසිදු කර, නාවා, කිරි දී නළවන ආකාරය මෙහි දී නිරූපිත ය. කවර තැනැත්තියකගේ වූ ව ද සිතෙහි දරු සෙනෙහසක් ජනනය කිරීමට මෙම පෙළපාළියෙහි අන්තර්ගත රංග සැලැස්ම හා ගායනා ශෛලිය සමත් බව පිළිගැනීමට සිදු වේ. මාතෘත්වය හා දරු සෙනෙහස වඩවාලීමට කාන්තා චරිතයක් ලෙස පුරුෂයෙක් දක්වන මෙම නර්තන පෙළපාළිය වන දරු නැළවිල්ලෙන් සිදු වනුයේ මනෝචිකිත්සක ක්‍රියාවලියකි. පහත දැක්වෙන දරු නැළවිල්ල හා කුල්ලේ පිදේනිය වැනි නාට්‍යමය පෙළපාළි ඇතුළත් රූප සටහන් මගින් එය නිරූපණය වෙයි.



රූප සටහන් 1, 2, 3 ඃ දරු නැළවිල්ල

රිද්දියාගය ශාන්තිකර්මයේ ප්‍රධාන වීදි මණ්ඩපය මල් මඩුව යි. රිද්දියාග මණ්ඩපය හෙවත් රටයකුම් වීදිය ලෙස හඳුන්වන මෙම සැරසිල්ලේ තොරන් හතකි. ඒ රිද්දි බිසවුන් සත් දෙනා වෙනුවෙනි. මීට අමතර ව රඟමඬලේ භාවිත කරන පිදේනි සඳහා කත්තිරික්ක හතරක් සහ සූනියම් වීදියක් ද යාග භූමි සැරසිල්ලේ දැකිය හැකි ය. මීට අමතර ව කපාල කුඩුවක්, දහඅටපාලි තොරණක්, දර හැවක්, ප්‍රේත තටුවක්, වට කුමාර වීදියක්, මල් බුලත් තටුව භාවිත කරනු ලැබේ.

රංග භාණ්ඩ ලෙස නානුමුරයේ දී භාවිතයට ගන්නා පනාව, කැඩපත, තෙල් කුප්පිය, හවරිය, සබන් කැල්ල, කුර, තෝඩු, මල් තැල්ල ආදිය ද කපුයක්කාරියේදී කපු ගස, කපු යන්තරය, ඉද්ද රොද, වලු පත, වෙල්ලිය, වලු කුර දැක්විය හැකි ය. මීට අමතර ව රංග භාණ්ඩ ලෙස භාවිත කරන පූජා භාණ්ඩ නමින් ද හඳුන්වන ආහාර්ය අභිනයට අයත් සැරසිලි ලෙස දැක්වීම උචිත ය. ඒ ගස, චාමර යුගළ, දෙකොන විලක්කුව, දුනු  පන්දම, කහ දියර වළඳ ආදිය ශාන්තිකර්ම ශිල්පියා ම තම පාරම්පරික දැනුම මත කෙසෙල් පතුරු, ගොක් කොළ සහ වෙනත් අවට පරිසරයෙන් සොයා ගන්නා දෑ එකතු කරගෙන සැරසිලි නිමවයි. මෙකී සැරසිලි සියල්ල ආහාර්ය අභිනය ලෙස හඳුන්වා දිය හැකි ය.

**රිද්දියාගය ශාන්තිකර්මයේ  අන්තර්ගත සංවාද මගින් සන්නිවේදනය වන මනෝචිකිත්සනය**

දේශීය ශාන්තිකර්මවල සංවාද භාවිතය දැකිය හැකි ලක්ෂණයකි. මෙම සංවාද මෙන් ම ශාන්තිකර්මයේ අන්තර්ගත සෑම වත් පිළිවෙතක් ම පාරම්පරික ව හා වාචික ව පැවත ඒම ද විශේෂ කරුණක් ලෙස සඳහන් කළ හැකි ය. රිද්දියාගය ශාන්තිකර්මයේ බොහෝ විට එහි අන්තර්ගත අර්ථ සන්නිවේදනය වනුයේ වාචික සන්නිවේදනයට අයත් සංවාද සන්නිවේදනය මගිනි. මනෝචිකිත්සන ක්‍රමවේදයක් වන රඟ දැක්වීමේ දී චින්තනමය වශයෙන් ආතුරයාගේ මනස ධනාත්මක කරවීමට රිද්දියාගයෙහි ඉදිරිපත් වන සංවාද වැදගත් වේ.

**රිද්දියාගයේ ආරම්භයේ දී විද්‍යමාන වන සන්නිවේදාත්මක සංවාද**

රිද්දියාගය ශාන්තිකර්මය ආරම්භයේ දී ප්‍රධාන යක්දෙස්සා විසින් ශාන්තිකර්මයට සහභාගි වන පාරම්පරික ප්‍රවීණ ශිල්පීන් හඳුන්වා දීම සහ ඔවුන්ගේ ගුණ වර්ණනාවක් සිදු කරනු ලබයි. මෙහි දී අන් ඇදුරන්ගේ සහාය ද ලබා ගනියි. යාගය ආරම්භයේ දී ආතුරයා පන්දලමට කැඳවීමෙන් පසු සිදු කරන්නා වූ ශාන්තිකර්මය පිළිබඳ හඳුන්වාදීම සහ පුරාවෘත්තය පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. නිවෙස් හිමියාගෙන් අවසර ගැනීම සහ සියලු ශිල්පීන් එකිනෙකාට ආචාර කිරීමෙන් පසු ප්‍රධාන ශිල්පියා විසින් ශාන්තිකර්මය ආරම්භ කරනු ලැබේ.

ප්‍රධාන යක්දෙස්සා : හොඳයි ආයුබෝවන් කියලා කතා කරේ ගුරුන්නාන්සේ අද මේ ස්ථානයේ රිද්දියාගයක් කරන්නයි හදන්නේ.

ගුරුන් : බොහොම හොඳයි.

ප්‍රධාන යක්දෙස්සා : ඉතින් ගුරුන්නාන්සේ මේ නිවසටත් නිවැසියන්ටත් ප්‍රධාන වශයෙන් (ආතුරයාගේ නම සහ විස්තරය කියයි.) දියණියටත් පැමිණ සිටින්නා වූ සැමටත් රටවාසීන් සැමටත් සෙතක් ශාන්තියක් වෙන්නෙයි කියලා හිතාගෙන අපි මේ ශාන්තිකර්මය පටන් ගන්නයි හදන්නේ ගුරුන්නාන්සේ.

ගුරුන් : හොඳයි එහෙනම් දීපංකර බුදුන් ප්‍රමුඛ අටවිසි බුදුවරුන් උදෙසාත් සමන්, විභීෂණ, නාථ, කතරගම, පත්තිනි, සූනියම් දේවතාවන් උදෙසා පුද පූජා, පුද පඬුරු, පිදවිලි, හාර හාර, ඔප්පු තිරප්පු සියල්ල කැප අරගෙන ආරම්භ කරනවා හොඳයි එහෙනම්. (විදානගමගේ, වික්‍රමතුංග, 2020-08-26)

**රිද්දියාගයෙහි පුද ලබන යක්ෂ යක්ෂණීන් සමඟ සන්නිවේදාත්මක සංවාද**

රිද්දියාගය ආරම්භයෙන් පසු ව කුමාර පිදේනිය කැප කිරීම, හැන්දෑ සමයමේ පුද ලබන කළු, රීරි, සන්නි යකුන්ට දොළ දීම, පිදවිලි පාවා දීම මගින් සංවාද මුල් කොටගෙන ඒ ඒ යක්ෂයන් පිළිබඳ අවබෝධයක් ඇති කරවා දොළ පිදේනි පුද දීම සිදු කරයි. රටයකුම ශාන්තිකර්මයේදී දක්නට ලැබෙන විශේෂතා අතර රීරි යකු රඟ මඬලට ගෙන්වීම දැක්විය හැකි ය. එහි දී සිදු වන සංවාදයක් පහත දැක්වෙයි.

ගුරුන් : මෙයා අරයා වගේ නෙමෙයි ටිකක් කළු උණාට රතු ම රතු යි. මෙයාට ටිකක් කැහිල්ල තියෙනවා වගෙයි.

යකැදුරා : ඇත්ත තේන්නම් මෙයාට කැහිල්ලක් තියෙනවා. වැඩිපුර කහන්නෙ නරක  තැන් වගේ.

ගුරුන් : එහෙම නෙමෙයි. මෙතනට ආපු ඕන ම කෙනෙක්ගෙන් නම දැනගන්න ඕන. කවුද  කියලා විස්තර දැනගන්න ඕන.

යකැදුරා : ඒයි යකෝ උඹ කවුද ?

ගුරුන් : ඔහොම කොඳුරලා හරියන්නෑ, ටිකක් හයියෙන් කතා කරන්න ඕන.

යකැදුරා : ඒයි යකෝ උඹ කවුද ? කොහෙ ඉඳල ද ආවේ? මොකට ද ආවේ?

රීරි යක්ෂයා : ඒයි යකෝ උඹ කවුද ? කොහෙ ඉඳල ද ආවේ? මොකට ද ආවේ?

යකැදුරා : වැඩේ හරි කතා කර ගත්තා

රීරි යක්ෂයා : වැඩේ හරි කතා කර ගත්තා

යකැදුරා : ගුරුන්නාන්සේ ගමරාළ සිල් ගත්තා වගේ ඒක ම කියවනවා.

රීරි යක්ෂයා : ගුරුන්නාන්සේ ගමරාළ සිල් ගත්තා වගේ ඒක ම කියවනවා. (බෙන්තරගේ, 2009)

මෙයට අමතර ව සූනියම් යක්ෂණිය සමඟ සිදු කරන සංවාදයක් ද රටයකුමෙහි දක්නට ලැබේ. මෙලෙස යකුන් ගෙන්වීම මගින් සිදු කරන්නේ ද යාතු කර්මයකි. නොයෙක් යක්ෂ කොට්ඨාස, කිලි මාල, ලේ මාල සහ අජීර්ණ ආදි දරුණු රෝග මෙන් ම ජන විශ්වාසය අනුව කළු යකා, රීරි යකා, කළු කුමාරයා වැනි යක්ෂයින් නිසා දරු ගැබ විනාශ වන බව පැවසෙයි. දරු ගැබ පිළිසිඳෙන නමුත් එය විනාශයට පත් විය හැකි ය. එය ගබ්සා වීම යැයි හඳුන්වයි. භූත විද්‍යාවට අනුව හීනෙන් බය වීම, කළු මිනිසුන් සිහිනෙන් දැකීම, අත පය සීතල වීම ආදි අසනීප දරු ගැබට හානි පමුණුවයි. එසේ ම මල්වර අවස්ථාවේ තනි වීම දරු ගැබ් විනාශ වීමට බලපාන බවට විශ්වාස කරනු ලබයි. රිද්දි බිසෝ සත් කට්ටුව දරුවන් නැති සොවින් පසු වූ නිසා වඳ බිසෝ යැයි හඳුන්වා ඇත. මොවුන්ගේ වඳභාවය ඇති කර ඇත්තේ කළු කුමාරයා විසිනි. කළු කුමාරයා ඕංකාර බිසවගේ ඇඟට වැසුණු බව කළු කුමාර යාදින්නේ මෙලෙස දැක්වෙයි.

එකළු කිරි මව් කුසින් - බිහිව එකුමරු එදා - එරන් කිරි මුබ වඩා - තුන් මසින් හිරු වඩා - සත් මසින් මේ වඩා - කළු කුමරු නම් තබා... ඇවිත් ඒ වීදි මැද සිටින ළඳ අඟන දුට - ඕංකාර බිසව දැක ඇගේ වැසෙමින් එදා ... (කළු කුමාර යාදින්න) (කොට්ටගොඩ, 1996)

කළු කුමාරයාගේ බලපෑම පහත සඳහන් කාව්‍ය මගින් ද ප්‍රකට වෙයි.

කළු මිනිසුන් ගොස් සිහිනෙන් සැතපීම  
නිතර බඩ ලෙඩින් දරුවන් නොලැබීම  
අඩු මාසෙන් ළමයා ගබ්සා වීම  
මෙ හැම දෝෂ දුරලති දොළ දුන්නා ම

මල්වර වෙලා ස්නානෙට යන ගමනේ  
මනකල් වෙලා හඬ තලමින් නාන තැනේ  
මල්වර තරුණ අඟනන් දැක අල්ලමිනේ  
ඇල්මෙන් රකින් ආතුර කළු කුමරුවනේ (කෝට්ටගොඩ, ජයසේන, 1998)

මෙයින් කළු කුමාරයා කාන්තාවන්ට රෝග ඇති කරන බව විශද වෙයි.

ආයුර්වේද වෛද්‍යවරයා වුව ද තුන් දොස් කිපීම නිසා ඇති වෙති'යි පැවසෙන රෝග ලක්ෂණ යකැදුරාගේ චිකිත්සාවෙහි ඇති කරන්නේ යකෙකු මගිනි. උන්මාදය, මූර්ඡාව හා අරුචිය ඇති වෙති' යි ආයුර්වේද වෛද්‍යවරයා කියන අතර, යකැදුරා පවසන්නේ ඔහුගේ ශාස්ත්‍රය අනුව ය. පහතරට ශාන්තිකර්මවල දී යකුන් යාග භූමියට ගෙන්වා පිදේනි දීම සිදු කරන අතර, එමගින් ද ලේ ආශ්‍රිත ව ඇති වන රෝග සමනය කර ගැනීම අපේක්ෂා කරයි. රිද්දියාගයේ දී දරු ගැබ් ආරක්ෂා කිරීම සඳහා මෙලෙස යකුන් ගෙන්වා පිදේනි දීම සිදු වේ.

**දොළහ පෙළපාළියට අයත් නානුමුරය හා දරු නැළවිල්ල සන්නිවේදනාත්මක සංවාද**

රිද්දියාගයෙහි **නානුමුරය** කාන්තාවක් පිරිසිදුව සිටීමේ අවශ්‍යතාවය හඟවන ප්‍රබල නිදසුනකි. දරුවා ගැබ් ගත් විට, රෝගවලින් මිදීමටත්, සෞඛ්‍ය සම්පන්න බවටත්, සිය පවිත්‍රතාවය ඉතා වැදගත් බව ආතුර කාන්තාවට සන්නවේදනය කරයි. එය ඇගේ මනසටත් කුසේ සිටින දරුවා නිරෝගීව මෙලොව බිහි වීමටත් හේතු වෙයි.

ඉසේ මල් පන්දු - කෙළක් විලසට ළන්දු  
එපෙති දිය බින්දු - කියති රාගම් ගීත සින්දු.  
කොකුම් සහ මුව මඳ - අඹරා පිනි දියෙන් සොඳ  
කලල් කර ඇති සොඳ - නානු තැටියක් යොදා මනනඳ. ( කාරියවසම්, 1995, නානුමුර කවි)  
නැම, සඳුන් ගෑම, අඳුන් ගෑම, හිස පීරීම, තෙල් ගෑම, ආභරණ පැලඳීම ආදි සියලු ම දෑ කවි ගායනා, සංවාද සමඟ රූපණයෙන් ඉදිරිපත් කරයි.

යකැදුරා : අනේ අයියා දූවිල්ලයි, පෙන්නන්නකො ළිඳ.

ගුරුන් : ඒ පාර මක්කැයි කර ගත්තෙ.

යකැදුරා : අනේ සඳ පෙන්නන්නකො ළිඳ.

ගුරුන් : ළිඳ වට කර කබරගොයා.

යකැදුරා : අයියා හරි සෙවලයා. මන් සබන් ගාන දිහාමයි බලන් ඉන්නෙ.

ගුරුන් : හරි වැඩේ වැඩක් නැත්නම් හොඳා (විදානගමගේ, වික්‍රමතුංග, 2020-08-26)



රූප සටහන් 8, 9, 10 නානුමුරය

රිද්දියාගය ශාන්තිකර්මයේ වඩාත් වැදගත් සන්නිවේදන ක්‍රියාවලියක් සිදු කරනු ලබන පෙළපාළි අංගයක් ලෙස **දරු නැළවිල්ල** පෙළපාළිය හැඳින්වේ. මෙහි දී සන්නිවේදනය කරනු ලබන්නේ දරුවකු ඉපදීමෙන් පසු දරුවා ආදරයෙන් රැක බලා ගැනීම ආදි මවකගෙන් දරුවාට අවශ්‍යයෙන් ම සිදු විය යුතු කටයුතු පිළිබඳ ව යි. තව ද මෙම පෙළපාළියේ කාව්‍යමය සංවාද මගින් ද දරුවා ඉපදීමට පෙර සිහිනය දැකීම හා සිහිනය තේරීම විශද කරයි.

බිසව් වෙස් ගත් ඇදුරා : ඌයි... ගුරුන්නාන්සේ ඌයි...

ගුරුන් : ඇයි ඇයි මොකෑ ඒ පාර?

බිසව් වෙස් ගත් ඇදුරා : ගුරුන්නාන්සේ මේකා මහ එපා කරපු එකා මහ එකා වගේමයි.

ගුරුන් : හා හා යෝදියෙ, ඔය කිරි සප්පයට ඔහොම කතා කියනව ද? ...

බිසව් වෙස් ගත් ඇදුරා : ඔන්න ගුරුන්නාන්සේ නාවලනම් ඉවරයි. ඊළඟට මොකක් ද කරන්න ඕන.

ගුරුන් : වේලෙන්න තෙත මාත්තු කරන්න ඕන.

බිසව් වෙස් ගත් ඇදුරා : එහෙනම් ගසලා වැලට දාමු.

ගුරුන් : එහෙම කරොත් හොඳට හිටියි. එහෙම නෙවෙයි සළුවක් ඇරන් තෙත මාත්තු කරන්න ඕන. (විදානගමගේ, වික්‍රමතුංග, 2020-08-26)





රූප සටහන් 11, 12 : දරු නැළවිල්ල

**දරු නැළවිල්ලේ කාව්‍යමය සංවාදයක් -**

දුටුවා සීනය නපුරට පෙනුණේ
ඒ දුක් සැප අද නොදනෙයි පමණේ
මට දුන් දුක් සැප නොදනෙයි පමණේ
තෝරා දුන් මට රෑ දුටු සී නේ

එරන් තෝඩු යහනේ සැතපෙන්නේ
එරන් යහන පිටමයි සැතපෙන්නේ
මෙවන් සීන මම දුටිමි බොලන්නේ
නොවන් දුකක් කුමරෙක් උපදින්නේ (කෝට්ටේගොඩ, 1997)

මෙලෙස සංවාද හා කවි ඉදිරිපත් කරමින් හා රංගනයෙන් ආතුර කාන්තාවගේ සිතිවිලි තම අරමුණ සඳහා ක්‍රියාත්මක කරවීමත් ධනාත්මක කරවීමත් සිදු වේ. දරුවා ලෙස ඉදිරිපත් කෙරෙන දඬු රුව තුරුල් කර ගනිමින් ආශිර්වාද කවි ගායනා කරමින් යාග මණ්ඩපයට පැමිණෙන යකැදුරා කවි ගායනා කරමින් දරුවා නැහැවීමට පුටුවක හිඳ ගනියි. දරුවා නැහැවීමේ සැබෑ මවකගේ ස්වරූපය මෙහි දී යකැදුරා විසින් අනුගමනය කරනු ලබයි. එහි දී දරුවාගේ හිස, කම්මුල්, නිකට, නාසය, අත්, පා සකසන ආකාරයත් නැහැවීම, සබන් ගෑම යනාදිය අනුකරණය කරයි. සැබෑ මවකගේ සෙනෙහසින් යුතු ව තම දරුවා පරිස්සමෙන් ඇති දැඩි කරන ආකාරය නිරූපණය කරයි. දරුවෙකු හා මව අතර පවත්නා භාවාත්මක සබඳතාව යකැදුරාගේ රංගනයෙන් මැනවින් ඉදිරිපත් කරයි. ආතුර කාන්තාවගේ මානසික ඒකාග්‍රතාව වඩවමින් සුවයක් අත් කර දෙයි.

**රිද්දියාගය ශාන්තිකර්මයෙන් සන්නිවේදනය වන මනෝචිකිත්සාව සහ ගර්භ සංරක්ෂණය**

රිද්දියාගය පවත්වනු ලබන්නේ ගර්භණී කාන්තාවන්ගේ දරු ගැබෙහි ආරක්ෂාව පතා වූ ව ද දරුවන් නොමැති කාන්තාවන් විෂයයෙහි ද දරුවන්ගේ ආරක්ෂාව උදෙසා ද මෙම යාග පවත්වනු ලැබේ. මෙහි පූජා විධි රටාවේ මූලික අංගය නාථ, විෂ්ණු, සමන්, කතරගම සහ පත්තිනි යන දෙවියන්ට මල් යහන් නැටීම යි. විශේෂයෙන් මාතර පළාත්වල සූනියම් දේවතාවට ආරාධනය හා සූනියම් වීදිය කැප කිරීම සිදු කරයි. ශාන්තිකර්මයේ ආරම්භය මෙලෙස දෙවියන් පිදීම මඟින් ආතුරයාට යම් ශාන්තියක් පිළිබඳව මූලික මනෝමය හැඟීම් සන්නිවේදනය කරයි.

මේ සඳහා ශාන්තිකර්ම ශිල්පියා පිළිබඳ ව මනා විශ්වාසයක් තහවුරු විය යුතු ය. එය මනෝමූලික ව ශාන්තිකර්මයේ අරම්භයේ සිටම අවසානය දක්වා ආතුරයාට ඇදුරා පසක් කළ යුතු ය. රිද්දියාගයේ ගිනි සිසිල, දුම්මල කීල ගැසීම, විලක්කු පද, දුම්මල පද, මහා කවිතාල නැටීම, ඊ ගහ පද, වටයක් පද, පස්ගම යකුන් පද නැටීම යන නර්තන අංග ගින්දර ඇඟලමින් හා තාණ්ඩව නර්තන විලාස මෙන් ම වේගවත් කැරකැවීම් (බඹර වළල්ල, මාලක්කම්) මගින් ශාන්තිකර්ම ශිල්පියා සතු හැකියාව සහ දක්ෂතාව නිරූපණය කරයි. (විදානගමගේ, වික්‍රමතුංග, 2020-08-26)

රිද්දියාගය ශාන්තිකර්මයේ වැදගත් ම මනෝචිකිත්සක සන්නිවේදනය වන්නේ රිද්දි බිසව් වෙස් ගත් ඇදුරා කාන්තා ලාලිත්‍යය විදහාපාමින් සිදු කරනු ලබන නර්තන අංග ය. ස්ත්‍රී පුරුෂ සංසර්ගයෙන් දරුවන් පිහිටන බැව් ඕනෑම තරාතිරමක පුද්ගලයෙක් දන්නා කරුණකි. එසේ වූ ව ද සමාජ ඇසුරක් නොමැති සාමාන්‍ය අවබෝධයෙන් තොර ස්ත්‍රී පුරුෂයන් පිටිසරබද පළාත්වල ජීවත් වන බව නොරහසකි. ඇතැම් විටක ලිංගික ජීවිතය සම්බන්ධ උපදෙස් දීමට තරම් දෙමව්පිය වැඩිහිටියෝ ඉදිරිපත් නොවෙති. රිද්දියාගය කිසියම් විවාහක යුවළකට සාර්ථක විවාහ ජීවිතයක් ගත කිරීමටත් දරුවන් ලබා ගැනීමටත් හැකි වන ආකාරයේ පසුබිමක් සකස් කර දෙයි. එමගින් ආතුර කාන්තාවට සිය ස්වාමි පුරුෂයා හා සංසර්ගයෙහි යෙදීමට පූර්වයෙන් සූදානම් විය යුතු බව ඒත්තු ගන්වයි. (නානු මුරය)

ශාරීරික දුබලතාවකින් තොර ව විවාහක ස්ත්‍රී පුරුෂ යුවළක්, දරුවන් ලබා ගැනීමේ අවශ්‍යතාව පූරණය කර ගන්නේ එකිනෙකාට දක්වන්නා වූ සමීප සබඳතාවෙහි ප්‍රතිඵලයක් ලෙස ය. වැඩිහිටි කැමැත්ත අනුව සිදුවන විවාහය අතීත සමාජයේ මහත් ප්‍රසාදයට පත් විය. එසේ ම ජීවිතයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය දෙමාපියන්ට නොදන්වා රහසක් සේ තබා ගැනීමට දරුවෝ පුරුදුව සිටියහ. ලිංගික සබඳතා නොපවත්වන අඹු සැමියෝ ද එක වහලක් යට ජීවත් වීමේ අවශ්‍යතාවය අත් නො හැරියහ. ඒ සමාජයේ සමච්චලයට ලක් නොවනු පිණිස ය. සැමියා බිරිඳ කෙරෙහිත්, බිරිඳ සැමියා කෙරෙහිත් නුරුස්නා අයුරින් බැලීමට පුරුදු ව සිටින්නේත් එක් අතකින් ලිංගික ජීවිතයෙහි සාර්ථකත්වය රඳා පවතින්නේත් එකිනෙකා දක්වන්නා වූ සමීප සබඳතාව සහ ප්‍රියමනාප බව මත ය.

ලිංගික කාර්යයට සූදානම් වන කාන්තාව නා පිරිසිදු වී, සුවඳ විලවුන් ගල්වා ආභරණයෙන් සැරසී යා යුතු ය. ස්වාමියා එකී කාර්යයට අද්දවා ගැනීමට හැකි වන ආකාරයේ සැරසීමක් හා අවශ්‍ය පරිසරය මවා ගැනීමේ හැකියාවක් කාන්තාවක කෙරෙහි පැවතිය යුතු ය. කාන්තාවක එසේ කළ යුතු බවක් අඟවන පෙළපාළියක් වූ නානුමුරය එය කදිමට නිරූපණය කර දක්වයි.

කන්ද මුදුන්නේ පොකුණක් මවාලා
එදිය කෙළින්නට බිසවක් මවාලා
<u>එපිල මෙපිල</u> මල් දෙවටක් ගොතාලා

බිසව් නාති රැලි උකුලේ නෙළාලා

ඇල් සවරිය ගෙන නා සිරි ළඳුනේ
පිල්මොනරිය කරලුවා සේ වැන්නේ
මල් සවරිය බැඳලා නිති සැර සෙන්නේ
මල් මද අනගි රුව නායක බිස වුන්නේ

ඉසේ මල් පන්දු - කෙළක් විලසට ළන්දු
එපෙති දිය බින්දු - කියති රාගම් ගීත සින්දු
කොකුම් සහ මුව මඳ - අඹරා පිනි දියෙන් සොඳ
කලල් කර ඇති සොඳ - නානු තැටියක් යොදා මනනඳ (කාරියවසම්, 1976)

නානුමුරය ලිංගික කාර්යයට සූදානම් වීමක් යැයි දක්වූ මහාචාර්ය තිස්ස කාරියවසම්, 'හිමියන් වෙත යන කල ආභරණ පැළඳ සුවඳ ඇඟ ගල්වාගෙන පට පිළියෙන් සැරසී ශ්‍රියා කාන්තාව ලෙසින් යා යුත්තී ය' (කාරියවසම්, 1995), යනුවෙන් කාව්‍යශේඛරයෙන් අදහස් ගෙන හැර දක්වා ඇත.
දරුවකු පිළිබඳ මනෝභාව උද්දීපනය කරන්නා වූ ප්‍රබල මනෝචිකිත්සක පෙළපාළි අංගයක් වන දරු නැළවිල්ල පූර්වයෙන් විස්තරාත්මක ව සඳහන් කර ඇත. මාතෘත්වය යනු ස්ත්‍රියක මිහිපිට ලබන්නා වූ උතුම් වූ පදවියකි. දයාව, කරුණාව සෙනෙහස හා ආදරය මවක් තුළ ජන්මයෙන් ම පිහිටනු ලබන්නේ එකී මාතෘත්වයේ පරම පිවිතුරු බව සුරැකීමට ය. ඕනෑ ම දරුවෙකුට එකී සෙනෙහස, ආදරය දැක්වීම මවකගේ ලක්‍ෂණයකි. දරු සෙනෙහසක් නොපිහිටන කාන්තාවන්ට දරුවන් නොපිහිටන්නේය යැයි විශ්වාසයක් සිංහල සමාජයේ පවතියි. රිද්දියාගයේ දී දරු නැළවිල්ලක් රඟ දක්වා ආතුරයා අතට දරුවා දෙනු ලබන්නේ දරු සෙනෙහසක් ආතුරයා තුළ ඇති කරලීමේ අදහසින් යැයි සිතිය හැකි ය. දරුවකු පිරිසිදු කර නාවා කිරි දී නළවන අයුරු මෙහි දී නිරූපණය කරන්නේ එනිසා ය. කවර අන්දමක හෝ තැනැත්තෙකුගේ සිතෙහි දරු සෙනෙහස මවා දක්වීමට තරම් මෙකී පෙළපාළියෙහි අන්තර්ගත රංග සැලැස්ම සහ ගායනා ශෛලිය සමත් බව පිළිගැනීමට සිදු වේ.

සිය දහසක් බිසවරු එක් වන්නේ
නායක වින්නඹු අම්මා එන්නේ
දෝතට වඩවා ගෙන මෙලෙ සින්නේ
වඩා බිළිඳු සුරතල් කරමින්නේ

අත්තක පිපි මලක් ලෙ සේ
පෙත්තක මල් රුවලක් සේ
සන්තක මගේ පුතු ගේ ය සේ
නෙත්දෙක ඇර බලන් මෙසේ

රුබර මගේ පුතනුව නේ
ගෝමර සැම තැන ඉසු ණේ
නාඹර මගේ කිරි දෙත නේ
කිරි බීපන් පුතනුව ණේ (විදානගමගේ, වික්‍රමතුංග, 2020-11-25)

දරුවා ස්නානය කරවන ආකාරය, කිරි දෙන ආකාරය ආදි ලෙස රූපණය කිරීමෙන් ආතුර කාන්තාවට ලැබෙනුයේ මානසික ව සතුටක් ලබා දෙයි. තම කුසේ සිටින දරුවාට මා ද මෙලෙස සැලකිය යුතු බවට ඇය ව සිතන්න පොළඹවයි. රටයකුමේ ඇඳුරන් ද ස්ත්‍රී විලාසයෙන් ඇඳුම් පැලඳුම් භාවිත කිරීම, මුහුණ කාන්තාවකගේ මෙන් සුදු කර තිබීම, තොල් රතු කර තිබීම ආදිය ද මනසට පියකරු බව, පිරිසිදු බව අවශ්‍ය බව හඟවයි. මෙයින් රිද්දියාගයෙන් සන්නිවේදනය වනුයේ මනෝචිකිත්සක ප්‍රතිකර්මයක් බව විශද වෙයි.

රිද්දියාගයෙන් නොයෙකුත් අරුත්බර සංකේතාත්මක අදහස් සන්නිවේදනය කරනු ලබන්නේ කාන්තා පක්ෂයට පමණක් නොවේ. කපුයක්කාරිය නම් පෙළපාළියෙන් බොහෝ දුරට ගම්‍යමාන වන්නේ පිරිමියෙකුට දෙන ලිංගික ඉඟි සමූහයකි. මෙහි දී පැදුරක් මත හිඳ ගන්නා රිද්දි බිසව තමා ඉදිරියෙන් කොට්ටෝරුවා හිඳුවාගෙන ඔහු තම ස්වාමියා ලෙස දක්වමින් සංවාදයේ යෙදෙයි. මෙහි දී ස්වාමියාගේ විරූපී බවක් පිළිබඳ ව හිස සිට පාදාන්තය දක්වා කියනු ලබන දේහ ලක්ෂණවලින් පිළිබිඹු කෙරෙයි. හේන් කෙටීමට සූදානම් වන බිසව සිය සැමියාගෙන් කිසිම අත් උදව්වක් නොලැබෙන බව පවසයි. තමා තනි ව ම මහන්සි වන බවත්, සිය සැමියා කරන්නේ කා බී නිදා ගැනීම බවත් ඉන් හඟවයි. ඇතැම් තැනක වඩු මාමා රිද්දි බිසවට උදව් කරන බවට ඉඟියෙන් පවසන අතර, කපුයක්කාරියේ සිදු කරනු ලබන සංවාද බොහෝ විට ලිංගික ක්‍රියා පිළිබඳ ඉඟි සන්නිවේදනය කරයි.

යකදුරා: හැබෑට ම ගුරුන්නාන්සේ මම දවසක් අපේ ගෙදර එක්කෙනාට කිව්වා. ඉස්සරහා ගෙදරත් කපු කටිනවා. පස්සේ ගෙදරත් කපු කටිනවා. අනේ සුදෝ අපිත් හෙනක් කොටල කපු වපුරමු කියලා.

ගුරුන් : ඉතින්.... ඉතින්....

යකදුරා : අනේ ඉතින්... මෙයා මගේ මූණ බලලා හිනා වෙන එක විතර ම යි වැඩේ.

ගුරුන් : අනේ ඇත්තට, හිනා වෙලා හරියන්නෙ නැහැ නෙව.

යකදුරා : දෙන්නත් එක්ක එකතු වෙලා එපායැ ඔය වැඩ කරන්න.

ගුරුන් : අනේ ගුරුන්නාන්සෙ, මට තනියම පුළුවන් ද හේන් කොටන්න.

යකදුරා : ඉතින් මෙයා ගෙදරට වෙලා මොනවද කරන්නෙ...?

ගුරුන් : මම ඔය කොහේ හරි ගිහිල්ලා මොනව හරි හොයාගෙන ඇවිත් තම්බලා පුච්චලා දුන්නම, පෙකනිය පිට පෙරලෙනකම් ඒවා කාලා කාලා ජේත්තෙයා වගේ ලිප් බොක්කට වෙලා නිදි.

යකදුරා : ඒ ලිප් බොක්කෙ රස්නෙට වෙන්න ඇති.

ගුරුන් : අනේ ඉතින් අපිට මොන රස්නයක් ද?

යකදුරා : මම තමයි පිරිමියෙක් ලබා ගත්තෙ.

ගුරුන් : එහෙම නෙවෙයි. පුරුදු වෙන්නත් එක්ක මොනවහරි වැඩක් කියල කරව
ගන් එපායැ.

යකදුරා: හොඳේ ගුරුන්නාන්සේ, මම දවසක් වඩු මාමලයි ගෙදර පිටත් කළා
මෙයාව. පොඩි අතමාරුවක් කරගෙන එන්න.

ගුරුන් : ඉතින් ඉතින්.... වඩු මාම දෙන්න ඇති නේද?

යකදුරා: කියනකං ඉන්නකො ගුරුන්නාන්සේ ... ඉතින් වඩු මාම ගෙදර ඉඳල
නැහැ.

ගුරුන් : වඩු මාමගේ පට්ටලේ යට ග්‍රීස් වගයක් තිබිලා... තම්බපු වට්ටක්කයි කියල
හිතල මෙයා ඔක්කොම කාලා.

යකදුරා : මළ හත්තිලව්වයි.

ගුරුන් : එදා ඉඳල මෙයා කොහේවත් පිටත් කරන්නෙ නැහැ.

යකදුරා : මං ම ගිහිල්ල එනවා වඩු මාමලයි ගෙදර.

ගුරුන් : ඔය ආවෙ පොටකට.

යකදුරා : නිකං ඉන්න ගුරුන්නාන්සෙ.

ගුරුන් ඉතින් දෙයියනේ ඔය වගේ මිනිහෙකුගෙන් ඇති වැඩේ මොකද් ද?

යකදුරා : වැඩක් නැහැ කියල අහක දාන්නය ගුරුන්නාන්සෙ. නමට හරි මිනිහෙක් කියල. ඉන්න එපායැ. (විදානගමගේ, වික්‍රමතුංග, 2020-11-25)

දරුවන් නොමැති විවාහක කතුන්ට සමාජයෙන් එල්ල වන දෝෂාරෝපණ ස්ත්‍රියට පමණක් එල්ල නො වී පුරුෂයාට ද ඒ පිළිබඳ වගකීමක් පවතින බව මෙම කප්පුයක්කාරිය නාට්‍යමය පෙළපාළියෙන් විශද කරයි. ගර්භ සංරක්ෂණය වෙනුවෙන් ගැමියා පවත්වන ලද රිද්දියාගය මගින් කාන්තාව පිළිබඳ සාවද්‍ය සමාජ ආකල්ප අතික්‍රමණය කර දරුවන් නොමැති කාන්තාව කෙරෙහි ඇති සමාජ චින්තනය නවමු මගකට යොමු කිරීමට සමත් වූ බව ඒ අනුව නිගමනය වේ.

**සමාලෝචනය**

රිද්දියාගය ශාන්තිකර්මයෙහි අන්තර්ගත පුද පූජා රටාවට අනුව ආතුරයා සමාධි ගත කිරීමේ පටන් අවසානයේ සෙත් පැතීම දක්වා ඇතුළත් පුද පූජා පෙළපාළි මගින් ආතුරයාගේ කායික, මානසික සහ ආධ්‍යාත්මික වශයෙන් පවතින්නා වූ ව්‍යාකූලභාව සංසිඳවීමට විවිධ මනෝචිකිත්සන ක්‍රම භාවිත කරයි. ඒ අතර ශාරීරික රෝග, මානසික රෝග, ආකල්ප හා විශ්වාස පිළිබඳව ආතුරයාට සන්නිවේදනය කරනු ලබන්නේ රටයකුම ශාන්තිකර්මයේ සතර අභිනය හා නර්තන, නාට්‍යමය පෙළපාළි මගිනි. මෙහි දී ශාන්තිකර්ම ශිල්පියා ශාන්තිකර්මයේ අන්තර්ගතය ආතුර පාර්ශවයට හා ශාන්තිකර්මය නරඹන්නන්ට පහසුවෙන් ග්‍රහණය කර ගැනීම සඳහා සංවාද භාවිත කරයි. සංවාද සාමාන්‍ය සමාජයේ භාවිත වන වාග් මාලාවන්ට අනුරූප ව ගොඩ නගාගෙන ඇත. විශේෂයෙන් පූජා විධි අතර සන්නිවේදන ලක්ෂණ රැසක් අන්තර්ගත වන අතර, පෙළපාළි සහ යක්ෂයින් ගෙන්වා කරනු ලබන කතා පුවත්, සංවාද අංග ලක්ෂණ චර්යා රටා හරහා විවිධ සංකේත මගින් සන්නිවේදන කරමින් මනෝ චිකිත්සන කාර්යය සිදු කරයි. හාස්‍යජනක සංවාද මෙන් ම ව්‍යංගාර්ථ සහිත සංවාද ඉදිරිපත් කරන අතර ගායන හා වාදන මගින් සිදු කරන චිකිත්සන ක්‍රියාවලිය ආතුර කාන්තාවට ලබා දෙන්නේ මානසික සුවයකි. මෙය හුදෙක් දරුවන් නොමැති කාන්තාවන්ට පමණක් නො ව ස්වාමි පුරුෂයාට ද වගකීම පැවරී ඇති බව හඟවන ශාන්තිකර්මයකි. එමගින් දරු එල නොමැති කාන්තාව දෙස මානව හිතවාදී දෘෂ්ටියකින් බැලීමට ද අවධානය යොමු කරන අතර, සමාජ දුර්මත වෙනස් කිරීමට රිද්දියාග ශාන්තිකර්ම ශිල්පියා උත්සුක වූ බව ද සිතිය හැකි ය.

**පරිශීලන**


කාරියවසම්, තිස්ස, (1976) **ශාන්තිකර්ම හා සිංහල සමාජය.** කොළඹ :ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ පුද්. සමාගම.

- (1995) **රට යකුම් යාග විග්‍රහය.** කොළඹ :ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ පුද්. සමාගම.

කෝට්ටගොඩ, ජේ., (1995) **පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය.** කොළඹ : ජේ. කේ. පබ්ලිකේෂන්.

- (1996) **කළු කුමාරයා පුද ලබන දාරක වත් පිළිවෙත්.**බොරලැස්ගමුව : ජේ. කේ. පබ්ලිකේෂන්.

- (1997) **රිද්දියාගය හෙවත් රටයකුම.** කොළඹ : ජේ. කේ පබ්ලිකේෂන්.

නන්දිකේශ්වර, (1991) **අභිනය දර්පණ.** (සිංහල පරිවර්තනය: පතිරණ, බී. ඒ. පී එස්.), කර්තෘ ප්‍රකාශන.

බෙන්තරගේ, ලයනල්., (2009) **රීරි යක් සංකල්පය සහ සමාජය.** කර්තෘ ප්‍රකාශන.

මාරසිංහ, ඩබ්., , (1991)**අභිනය දර්පණම්.** කොළඹ :ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ පුද්. සමාගම.

- (1998) **සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය හා රත්නාවලී.**කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ පුද්. සමාගම.

විජේතුංග, හරිස්චන්ද්‍ර, (1978) **නූතන සිංහල පාරිභාෂික ශබ්දකෝෂය.**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ පුද්. සමාගම.

සිංහල ශබ්දකෝෂය, (සංස්.) (1991) 24 කාණ්ඩය, කොළඹ : සංස්කෘතික දෙපාර්තමේන්තුව.

**සිංහල විශ්වකෝෂය.** (සංස්.) (1998) 9 වන කාණ්ඩය, කොළඹ : සංස්කෘතික දෙපාර්තමේන්තුව.

**සිංහල විශ්වකෝෂය.** (සංස්.) (2006) 11 වන කාණ්ඩය, කොළඹ : සංස්කෘතික දෙපාර්තමේන්තුව.

සරච්චන්ද්‍ර, ඊ., (1997) **සිංහල ගැමි නාටකය.** කොළඹ :ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ පුද්. සමාගම.

බමුණුගම, ඒ., (2020-05-20) **සංගීත චිකිත්සාව පිළිබඳ පිළිබඳ පර්යේෂණ.**
https://swaraabhimanee.wordpress.com/2020/05/20

විදානගමගේ, සුසන්ත සහ වික්‍රමතුංග හර්ෂ, (2020-08-26) රිද්දියාගයෙහි නර්තන පෙළපාලි, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

විදානගමගේ, සුසන්ත සහ වික්‍රමතුංග හර්ෂ, (2020-11-25) රිද්දියාගයෙහි නර්තන පෙළපාලි, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.